# <u>ව්‍යාපෘති මාර්ගෝපදේශය (Term Of Reference -TOR)</u>

1. මෙරට ආනයන සීමා කරනු ලැබූ ආහාර මෙරට තුලදී නිෂ්පාදනය කර වෙළඳපලට සැපයීම, අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන ඉහල නැංවීම තුලින් දේශීය ආදායම ඉහල නැංවීම, මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණු වන අතර පරිසර හිතකාමී කෘෂි තාක්ෂණික ක්‍රම භාවිතයෙන් විවිධාංගීකරණය කරමින් භූමිය ඵලදායීව උපයෝජනය කිරීමට අපේක්ෂා කෙරේ. තවද මීට අමතරව කෘෂි පාරිසරික සංචාරක කර්මාන්තය සඳහා මෙම භූමිය භාවිතා කිරීම තුලින් භූමියේ ඵලදායිතාව ඉහල නැංවීමද අපේක්ෂා කෙරේ.

2. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ ආයෝජකයා විසින් මෙතෙක් ගෙවීමට ඇති සේවකයින් සඳහා වන මුළු දායකත්ව මුදල ( සේවක අර්ථසාධක, සේවක භාරකාර අරමුදල,පාරිතෝෂිත) ගෙවීමට සිදුවන අතර හා මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගමහි වත්කම් නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම,වත්කම් ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රමිතියට සහ පිරිවිතරයන්ට අනුව සිදු කළ යුතු වේ.

3. අභිලාශයන් කැඳවීමේදී ගිරාදුරුකෝට්ටෙ හා දම්මින්න ගොවිපල ද්විත්වය ස්වාධීන ඒකක දෙකක් ලෙස සලකා වෙන් වෙන් වශයෙන් අභිලාශයන් කැඳවන අතර එම ඒකක ද්විත්වය සඳහාම තනි අයෝජකයෙකුට වුවද අයදුම් කල හැකිය. එසේ තනි ආයෝජකයෙකු ලෙස අයදුම් කරන අවස්ථාවක වෙන් වෙන්ව ඉල්ලුම්පත්‍ර 02 ක් ඉදිරිපත් කල යුතුය.

4. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සේවකයින්, අමාත්‍ය මණ්ඩලය පත් කල සාකච්ඡා සම්මුති කමිටුවෙහි (Cabinet Appointed Negotiating Committee -CANC) හා ව්‍යාපෘති කමිටුවෙහි ( Project Committee -PC ) සාමාජිකයින්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි හා මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ ඔවුන්ගේ ඥාතීන් (කලත්‍රයා සහ දරුවන්) අභිලාශයන් ප්‍රකාශ කිරීමට සුදුසුකම් නොලබයි.

5. ඉදිරිපත් කර ඇති අභිලාශයන්ට අදාලව මූලික තෝරා ගැනීමෙන් පසු, තෝරා ගනු ලබන ආයෝජකයන් ක්ෂේත්‍ර පරික්ෂාවට සහභාගි කෙරේ.

6. ක්ෂේත්‍ර පරීක්ෂාවෙන් පසු RFP ගොනුව ඔබ / ඔබ ආයතනය වෙත ලබා දෙනු ලබයි.

7. RFP ගොනුව පිළිබඳ පැහැදිලි කිරීමක් හා ව්‍යාපෘති වාර්තාව සකස් විය යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරීමට ආයෝජකයන් සඳහා රැස්වීමක් RFP ගොනුව ඔබ/ ඔබ ආයතනය වෙත ලබා දී මසක් ඇතුලත ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් පවත්වනු ලබන අතර ඒ සඳහා අනිවාර්යයෙන් ඔබ / ඔබ ආයතනය සහභාගී විය යුතුය.

8. ඉන්පසු RFP ගොනුව පිළිබඳ පැහැදිලි කිරීමක් හා ව්‍යාපෘති වාර්තාව සකස් විය යුතු ආකාරය පිළිබඳ පැහැදිලි කිරීම සඳහා සිදු කරනු ලබන ඉල්ලීම් සම්බන්ධව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඔබ / ඔබ ආයතනය වෙත ප්‍රතිචාර දැක්වීමට බැඳී නොමැත.

9. යෝජනාව සකස් කිරීමේදී, ඔබ /ඔබ ආයතනය විසින් සවිස්තරාත්මකව තොරතුරු ඇතුලත් කල යුතු අතර ඉල්ලා සිටින තොරතුරු අඩුපාඩු සහිතව ඉදිරිපත් කිරීම, යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැක.

10. රජයේ ටෙන්ඩර් පටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ හා 2019.03.26 දින මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කල රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2019 දරන චක්‍රලේඛ වලට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලබයි.

11. ඔබ / ඔබ ආයතනය මෙම ව්‍යාපෘතිය සඳහා පාර්ශවකරුවෙකු ලෙස තෝරා ගතහොත් මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම නමින් ඇති වගකීම් සහ බැරකම් (ණයහිමි නොවන) පියවීමට හෝ බාර ගැනීමට යටත්ව අදියර දෙකක් යටතේ අවුරුදු 25ක කාල සීමාවක් සඳහා ගිවිසුම් ගත වනු ඇත.

12. පලමු අදියර ලෙස වසර 05 ක් සඳහා ගොඩනැඟීම, පවත්වාගෙන යාම හා අදාළ කාල සීමාව අවසානයේ සමාගමේ පූර්ණ හිමිකම යළි මහවැලි අධිකාරිය වෙත ආපසු භාරදීමේ ක්‍රමවේදයට (Build – Operate – Transfer ) යටත්ව ගිවිසුම් ගත වන අතර පළමු අදියර ඇතුලත ඔබගේ /ඔබ ආයතනයේ යෝජිත ආයෝජනය සම්පූර්ණ කර වාණිජ මෙහෙයුම් ආරම්භ කල යුතුය.

13. පලමු අදියර තුලදී ඔබ /ඔබ ආයතනය විසින් යෝජනා කොට ඇති ව්‍යාපෘති යෝජනාව ආරම්භ කිරීම සඳහා සහනදායී කාල සීමාවක් ලෙස ප්‍රථම මාස 06 ක කාලයක් ලබා දෙනු ලබයි.

14. එම ප්‍රථම මාස 06 කාල සීමාව තුලදී මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම මඟින් දැනට පවත්වා ගෙන යනු ලබන සියලු මෙහෙයුම් කටයුතු වල කළමණාකාරීත්වය ඔබ/ ඔබ ආයතනය විසින් පවත්වා ගෙන යාම සිදු කල යුතු වේ.

15. ඔබ / ඔබ ආයතනය විසින් ඉදිරිපත් කල ආයෝජන සැලැස්මෙහි පරිදි ඔබ / ඔබ ආයතනය විසින් සිදු කර ඇති ආයෝජනය පිළිබඳව අදාල අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කරනු ලබන තාක්ෂණික කමිටුවක් මඟින් වාර්ශිකව ඇගයීමකට ලක් කරනු ලබන අතර එම කමිටුව විසින් අවුරුදු 05ක කාල සීමාව අවසානයේදී සිදු කර ඇති සමස්ථ ආයෝජනය පිළිබඳව ප්‍රගති සමාලෝචනයක් සිදු කරනු ලබන අතර එහි ප්‍රථිපල මත දෙවන අදියරය ලෙස තවත් වසර 20 ක් සඳහා පලමු අදියර තුලදී අනුගමනය කල ක්‍රමවේදයට යටත්ව ගිවිසුමක් මඟින් ඔබ / ඔබ ආයතනය වෙත ලබා දීම සලකා බලනු ලබයි.

16. ඉහත අංක 15 හි සඳහන් පරිදි සිදු කරනු ලබන ප්‍රගති සමාලෝචනයේදී, ඔබ / ඔබ ආයතනය විසින් ඉදිරිපත් කල ආයෝජන සැලැස්මෙහි පරිදි ආයෝජනය සිදු කොට නොමැති බව තහවුරු වන අවස්ථාවකදී පලමු අදියරයේදී ඇති කර ගත් ගිවිසුම අවලංගු වන අතර එවැනි අවස්ථාවකදී ඔබ / ඔබ ආයතනය දෙවන අදියර සඳහා සුදුසුකම් නොලබයි.

17. දෙවන අදියරයේදී ඇති කර ගත් ගිවිසුම, කල් පිරීමේදී අවලංගු වන අතර මෙම ගිවිසුම තවදුරටත් දීර්ඝ කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී යලි සමාලෝචනයක් සිදු කර එකඟ වූ කාල සීමාවකට ගිවිසුම දීර්ඝ කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මඟින් සිදු කරනු ලබයි.

18. වසර 25 ක කාල පරිච්ඡේදය තුල , ගිවිසුමට අනුව , ගිවිසුම් කාලය පුරාවටම වාණිජ ප්‍රතිලාභ භුක්ති විඳිමින් ව්‍යාපෘති පහසුකම් සැලසුම් කිරීම ,ක්‍රියාත්මක කිරීම , සම්පත් වෙන් කිරීම, අලෙවිකරණය, නඩත්තු කිරීම සහ අධීක්ෂණය කිරීම ඔබ / ඔබ ආයතනය වෙත පැවරී ඇත.

19. මෙම ව්‍යාපෘතිය තුලදී ඔබ /ඔබ ආයතනය විසින් සමාගමෙහි තක්සේරු වටිනාකමින් 4% ක් සහ දළ ආදායමෙන් 1% ක මුදලක් පහත දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබා දිය යුතුය.

    i. ආයෝජකයා විසින් තක්සේරු වටිනාකමින් 4% ක මුදල සෑම වර්ෂයක් ආරම්භයේ දී පලමු මස 10 වන දිනට ප්‍රථමව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබා දිය යුතුය.

    ii. සහනදායී කාලය වන පළමු අවුරුද්දක කාල සීමාවෙන් පසු දළ ආදායමෙන් 1% ක මුදල කාර්තු වශයෙන් සෑම කාර්තුවකම 10 වන දිනට ප්‍රථමව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලබා දිය යුතුය.

20. මීට අමතරව , රජයට ගෙවිය යුතු සියලුම බදු සහ අයකිරීම් අයෝජකයා විසින් ගෙවිය යුතු අතර එම තොරතුරු ඉල්ලුම් කරන ඕනෑම අවස්ථාවකදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතුය.

21. ව්‍යාපෘති යෝජනා ලබා දීමේදී මෘදු පිටපතක් (Soft copy) සමඟ මුල් යෝජනාවේ දෘඩ පිටපත් (Hard copy) 5ක් සකස් කර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

22. කිසියම් ආයෝජකයෙකු තම යෝජනාවට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සම්බන්ධ කර ගැනීමට කැමති නම්, ඔහු එය විද්‍යුත් තැපැල හරහා කළ යුතුය. යෝජනා ඇගයීම, යෝජනා සංසන්දනය හෝ ගිවිසුම් ගත වීමේ තීරණවලදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හට බලපෑම් කිරීමට ආයෝජකයා දරන ඕනෑම උත්සාහයක් යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට හේතු විය හැක.

23. යෝජනා ඇගයීමෙන් පසු වැඩිම ලකුණු ලබාගත් ආයෝජකයා මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා අතර ඒ සම්බන්ධව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් විධිමත්ව ආයෝජකයා වෙත දන්වනු ඇත.

24. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ තෝරාගත් ආයෝජකයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු ගිවිසුම සකස් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන අතර සාකච්ඡා අසාර්ථක වුවහොත්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මූලික සුදුසුකම් සපුරා ඇති ඉහල ලකුණු ලබා ගත් අනෙක් ආයෝජකයින් වෙත සාකච්ඡා කිරීම සඳහා ආරාධනා කරනු ඇත.

25. තෝරාගත් ආයෝජකයා විසින් නියමිත දිනයේ සහ නියමිත ස්ථානයේ මෙහෙයුම් කටයුතු කල යුතුය.

26. මෙම ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ වන ආයෝජකයෙකුට හෝ ආයෝජන සමාගමක් සඳහා කිසිදු අවස්ථාවක මහවැලි අධිකාරිය සතු චංචල හා නිශ්චල දේපල ඇපයට තබා ශ්‍රී ලාංකික හෝ විදේශීය මූල්‍ය ආයතන සමඟ කවර හෝ ආකාරයේ මූල්‍ය බැඳීමක් සඳහා බලය ලබා දීමක් මෙම ව්‍යාපෘතිය මඟින් සිදු නොවේ.

27. ගිවිසුමට අනුව, ඔබ/ ඔබ ආයතනය වෙත ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් පූර්ව අනුමැතියක් ලබා නොගෙන වට්ටෝරු ලේඛණයෙහි ඇතුලත් කර ඇති වත්කම් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම සපුරා තහනම් වේ.

28. මෙහි සංවර්ධන කටයුතු සිදු කිරීමේදී භූමියේ පිහිටි ඛනිජ ද්‍රව්‍ය හා පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ද්‍රව්‍ය කිසිදු ලෙසක එම ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

29. ගිවිසුම් කාලය අවසානයේදී ව්‍යාපෘති වත්කම් සියල්ල නැවත ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාර දිය යුතු අතර ඒ වන විට පවතින ( අවසන් වසර 05 තුල පවතින ) තාක්ෂණයට ගැලපෙන ලෙස එම වත්කම් සියල්ල යාවත්කාලීන වී තිබිය යුතුය.

30. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ආයෝජකයා ඉහළම ආචාර ධර්ම පිළිපැදීම අවශ්‍ය වේ.

31. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් නිර්දේශිත ආයෝජකයා දූෂිත හෝ වංචනික ක්‍රියාවන්හි යෙදී ඇති බව නීතිය ඉදිරියේ තහවුරු වන්නේ නම් ඉදිරිපත් කල යෝජනාව ප්‍රතික්ෂේප කරනු ඇත.

32. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී රජය විසින් පනවා ඇති සහ ඉදිරියේදී පනවනු ලබන නීතිරීති හා අණපනත් වලට යටත්ව ක්‍රියාත්මක කල යුතු අතර මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳ තීරණය කිරීමේ අයිතිය හා අවසන් තීරණය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.